www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා හමුදාව එල්ටීටීඊ බල මධ්‍යස්ථාන වෙත ඉදිරියට යද්දී යුද ගැටුම් උත්සන්න වෙයි

## Fighting intensifies as Sri Lankan army advances on LTTE stronghold

**සරත් කුමාර විසිනි**
**2008 සැප්තැම්බර් 29**

පසුගිය දශකය තිස්සේ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ දේශපාලනික හා මිලිටරි මූලස්ථානය ලෙස ක්‍රියාත්මක වී ඇති කිලිනොච්චි නගරය දෙසට ආන්ඩුවේ හමුදා ඉදිරියට යද්දී උතුරු ශ්‍රී ලංකාවේ දරුනු සටන් සිදුවෙමින් පවතී. කිලිනොච්චිය හමුදාව අතට පත් වීම එල්ටීටීඊයට සැලකිය යුතු මිලිටරි පසුබෑමක් පමනක් නොව වෙනම දෙමල රාජ්‍ය කැබැලිත්තක් සඳහා වූ එහි දේශපාලන අභිලාෂයන්ට එල්ල වන ප්‍රහාරයක් ද වනු ඇත.

ශ්‍රී ලංකාවේ මිලිටරිය දිවයිනේ නැගෙනහිර පලාතේ ඉතිරිව පැවති එල්ටීටීඊ බල මධ්‍යස්ථානවලින් එල්ටීටීඊය පලවා හැරීමෙන් පසුව 2007 ජුලි මස සිට උතුරේ වන්නි කලාපය මත සිය ආක්‍රමනික මෙහෙයුම් සංකේන්ද්‍රනය කර ඇත. පසුගිය මාස තුන තිස්සේ, එල්ටීටීඊයට මන්නාරම, විඩුතලතිව් සහ මල්ලාවි යන ප්‍රදේශවල කොටස් ඇතුලු බටහිර වන්නියේ සැලකිය යුතු ප්‍රදේශ ගනනාවක පාලනය අහිමි වී තිබේ. කිලිනොච්චිය අල්ලා ගත හොත්, බටහිර වන්නියේ ඉතිරිව පවත්නා එල්ටීටීඊ-පාලිත ප්‍රදේශ සහ යාපන අර්ධද්වීපයේ හා නැගෙනහිර වන්නියේ එහි බල මධ්‍යස්ථාන, විශේෂයෙන් ම නැගෙනහිර වෙරලබඩ මුලතිව්හි පිහිටි එහි ප්‍රධාන කඳවුර අතර පනිවිඩ හුවමාරු හා සැපයුම් මාර්ග කපා හැරීමට හමුදාව සමත් වනු ඇත.

එල්ටීටීඊය මැනවින් සූදානම් කෙරුනු ආරක්ෂක ස්ථානවල සිට බොහෝ සෙයින් ප්‍රහාර වැලැක්වීමේ සටනක් ගෙන යමින් සිටී. එහෙත් සතුරා ක්‍රමානුකූලව විනාශ කිරීමේ නිරන්තර යුද ප්‍රහාර තුල සිය සුපිරි මිනිස් බලය සහ ගිනි බලය යොදා ගෙන ඇති මිලිටරියේ ඉදිරි ගමන නවතාලීමට එය සමත් වී නැත. පසුගිය සඳුදා යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා මෙසේ පුරසාරම් දෙඩී යː “හමුදාව ඉන්නෙ කිලිනොච්චි නගරයට කිලෝමීටර් හතරක පමන දුරකින්. ඇත්ත වසයෙන් ම, අපට සමහර ගොඩනැගිලි පේනවත් එක්ක. . . . ඊලග සතියෙදි අපි කිලිනොච්චිය දෙසට පලමු වෙඩි ප්‍රහාර එල්ල කරනව.”

ඊයේ සන්ඩේ ටයිම්ස් පත්‍රයට අනුව, පසුගිය සිකුරාදා, ගුවන් හමුදාව, කිලිනොච්චිය තුල හා ඒ අවට ස්ථාන ද ඇතුලු, වන්නි ප්‍රදේශයේ ඉලක්ක වෙත සිය බෝම්බ ප්‍රහාර උත්සන්න කලේ ය. මිලිටරියේ ඉදිරි ගමනේ ක්ෂනික ඉලක්කය වන්නේ, ශ්‍රී ලංකාවේ ප්‍රධාන උතුරු-දකුනු මාර්ගය වන ඒ-9 මහා මාර්ගයේ පිහිටි කොකාවිල් නම් කුඩා නගරය යි. එය අල්ලා ගැනීම එම මහා මාර්ගයේ කොකාවිල්වලට දකුනින් පිහිටි එල්ටීටීඊ-පාලිත ප්‍රදේශ සහ කිලිනොච්චිය අතර සම්බන්ධය බිඳ වැටෙනු ඇත.

වන්නියේ විශාලතම නගරය වන කිලිනොච්චියෙන් බොහෝ සිවිල් වැසියන් දැනටමත් පලා ගොස් තිබේ. සන්ඩේ ටයිම්ස් පත්‍රය මෙසේ ලිවී යː “ඊයේ වන විට, ප්‍රදේශයේ සිවිල් වැසියන්ගෙන් සියයට 85ක් නගරය හා එය අවට ප්‍රදේශ හැර ගොස් ඇති බව වාර්තා සඳහන් කලේ ය. ගරිල්ලන් විසින් පවත්වා ගෙන යනු ලබන සමහර කාර්යාල ද ඉවත් කර ගෙන තිබේ. ගරිල්ලන් තවමත් ප්‍රදේශයේ රැඳී සිටින නමුත් සමහර කඳවුරු ද ඉවත් කර ගෙන ඇත. ලමුන් 30,000කට අධ්‍යාපනය ලබා දුන් පාසල් වසා දමා තිබේ. කච්චේරිය පමනක් සීමිත කාර්ය මන්ඩලයක් සහිතව ක්‍රියාත්මක විය.”

පෙරමුනු තුනක සටන් පවතී. මල්ලාවි නම් ප්‍රධාන නගරය අල්ලා ගැනීමෙන් පසුව, හමුදාව අක්කරායන්කුලම් මත සිය සටන සංකේන්ද්‍රනය කර තිබේ. එය හමුදාව කිලිනොච්චියට වඩා ආසන්න කරනු ඇත. පූනරින් අල්ලා ගෙන යාපන අර්ධද්වීපයට දිවෙන ඒ-32 මහා මාර්ගය විවෘත කර ගැනීමේ වඩා පුලුල් ආක්‍රමනික මෙහෙයුමක කොටසක් ලෙස, බටහිර වෙරලබඩ නච්චිකුඩා වෙත ද හමුදාව ගමන් කරමින් සිටී. බටහිර වෙරලබඩ එල්ටීටීඊ කඳවුරු අල්ලා ගැනීම මගින් මිලිටරිය උත්සාහ කරන්නේ, දකුනු ඉන්දියාවේ සිට ලැබෙන එල්ටීටීඊ සැපයුම් කපා හැරීමට යි. නැගෙනහිර වැලිඔය වටා වූ තෙවන පෙරමුනක, ආන්ඩුවේ හමුදා ප්‍රදේශ ගනනාවක් අල්ලා ගෙන තිබේ.

මිලිටරිය හා එල්ටීටීඊය යන දෙපාර්ශ්වය ම දරුනු සටන් පිලිබඳව වාර්තා කර ඇත. ආරක්ෂක

අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පසුගිය සිකුරාදා මෙසේ සඳහන් කලේ යඃ "කොටි දිග්ගැසුනු මිලිටරි ඉදිරි ගමනට එරෙහිව තදබල ප්‍රතිරෝධයක් දක්වන තතු යටතේ, ප්‍රදේශයෙන්, විශේෂයෙන් ම අක්කරායන්කුලම් හා නාච්චිකුඩාවලින් හමුදාව සහ එල්ටීටීඊය අතර අඛන්ඩ සටන් වාර්තා වන බව ආරක්ෂක නිරීක්ෂකයෝ සඳහන් කරති. මූලෝපායිකව මෙය වන්නියේ මිලිටරි ඉදිරි ගමනේ වඩා වැදගත් අදියරකිඃ ඒ-32 මාර්ගය ඔස්සේ ඊලග නැවතුම් ස්ථානය වන්නේ පූනරින් ය. එල්ටීටීඊය සිය කාල තුවක්කු බලකායෙන් බොහොමයක් ස්ථාන ගත කොට ඇත්තේ යයි විශ්වාස කෙරෙන්නේ එහි ය."

මරන සංඛ්‍යාව අඛන්ඩව ඉහල නගී. දෙපාර්ශ්වය ම බොහෝ සෙයින් එකිනෙකට වෙනස් සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරති. සැප්තැම්බර් 15 දා, අක්කරායන්කුලම් අවට සිදු වූ යුද ගැටුම්වල දී සොල්දාදුවන් 22ක් මරා දමා 53කට තුවාල සිදු කල බව එල්ටීටීඊය වාර්තා කල අතර, මිලිටරිය පිලිගත්තේ තිදෙනකු පමනක් මිය ගොස් නව දෙනෙකුට පමනක් තුවාල සිදු වූ බව යි. සැප්තැම්බර් 19 දා, ආරක්ෂක අමාත්‍යාංශය කියාපෑවේ, එම ප්‍රදේශයේ දී ම හමුදාව සිය පසු දෙනෙකුගේ ජීවිත අහිමි කර ගෙන එල්ටීටීඊ භටයන් 17ක් මරා දමා ඇති බව යි. මාධ්‍යවේදීන්ට යුද පෙරමුනු ප්‍රදේශ තහනම් කර ඇති නිසා සහ මිලිටරිය සමග සබඳතා තිබෙන වාර්තාකරුවන්ට පවා ආරක්ෂක අමාත්‍යාංශයේ වාර්තා විවේචනය කිරීම හෝ ඒවාට පටහැනි ආකාරයේ වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් තර්ජනය කර තිබෙන බැවින් මෙම සංඛ්‍යාවල නිරවද්‍යතාව තහවුරු කර ගැනීමේ විධියක් නැත.

සිය සාමාජිකයන්ගේ ධෛර්‍යය ඉහල දමා ගැනීමේ ප්‍රයත්නයක් ලෙස, එල්ටීටීඊය සැප්තැම්බර් 9 දා වවුනියාවේ මිලිටරි අන දෙන මධ්‍යස්ථාන සංකීර්නයට ප්‍රහාරයක් එල්ල කලේ ය. කාලතුවක්කුවල හා සැහැල්ලු ගුවන් යානා දෙකක පිටුබලය ලද මරාගෙන මැරෙන බෝම්බකරුවන් ගනනාවක්, එල්ටීටීඊයේ ගුවන් යානා නිරීක්ෂනය කිරීමට හා ගුවන් හමුදාවේ බෝම්බ ප්‍රහාරවලට මග පෙන්වීමට යොදා ගැනෙන මිලිටරියේ ප්‍රධාන රාඩාර් කුලුන ඉලක්ක කර ගෙන ඇති බව පෙනී යයි. සොල්දාදුවන් 12ක්, පොලිස් භටයකු සහ එල්ටීටීඊ සටන්කරුවන් 11ක් ඇතුලු අඩු ගනනේ 25 දෙනෙක් ප්‍රහාරයෙන් මිය ගියේ ය. තමන් එල්ටීටීඊ ගුවන් යානාවක් වෙඩි තබා බිම හෙලූ බව ගුවන් හමුදාව කියා පෑවේ ය.

ආන්ඩුවේ වර්ගවාදී යුද්ධයට ඉන්දියාව ලබා දෙන සහයෝගයේ පරිමාව අවධාරනය කරමින්, ප්‍රහාරයෙන් තුවාල ලැබූවන් අතර ඉන්දියානු තාක්ෂන ශිල්පීන් දෙදෙනෙක් ද විය. දකුනු ඉන්දියාවේ දෙමල ජනගහනය අතර පවත්නා කෝපය අස්වැසීමේ විධික්‍රමයක් ලෙස ඉන්දියානු ආන්ඩුව යුද්ධයට දේශපාලන විසඳුමක් සඳහා දිගට ම කැඳවුම් කරයි. කෙසේ වෙතත්, එමෙන් ම, එල්ටීටීඊය ලබා ගන්නා මොන යම් හෝ ජයග්‍රහනයක් ඉන්දියාව තුල බෙදුම්වාදී ව්‍යාපාර දිරිගන්වනු ඇත යන්න පිලිබඳව නව දිල්ලිය උත්සුක වී සිටී. එහි ප්‍රතිඵලයක් ලෙස, ඉන්දියාව ශ්‍රී ලංකාවේ හමුදාවට නිහඬව පිටුබලය සපයා ඇත.

## දුර්වල වී ඇති එල්ටීටීඊයක්

එල්ටීටීඊයේ මිලිටරි තත්වය වඩ වඩාත් මංමුලා සහගත බවක් පෙනී යයි. එය සිය පාලනය යටතේ පවත්නා ප්‍රදේශ තුල සිටින ශාරීරික හැකියාවෙන් යුක්ත සියලු සිවිල් ජනයා මිලිටරි පුහුනුව සඳහා කැඳවා ඇත. අතීතයේ දී සිය සංවිධානය "මහජන හමුදාවක් ගොඩනගා" නොනවතින රැලි මගින් ආන්ඩුවේ කඳවුරු අත්පත් කර ගෙන ඇති බව, අගෝස්තු මාසයේ දී දුන් සම්මුඛ සාකච්ඡාවක දී එල්ටීටීඊ දේශපාලන අංශයේ නායක බී. නඩේසන් කියාපෑවේ ය. වත්මන් ආක්‍රමනවල අර්ථභාරය අඩුතක්සේරු කල ඔහු එල්ටීටීඊය මිලිටරියට උගුලක් සකසමින් සිටින බව ද ඇඟවී ය.

"සිවිල් වැසියන් (1990 ගනන් මැද දී) යාපන අර්ධද්වීපයෙන් පලා ගියාම, හැමෝම හිතුවෙ එල්ටීටීඊය දුර්වල වෙලා කියලා. ඒ වුනත් අපි ආයිත් මුලතිව් ජය ගත්තහම අපි ලෝකයට පෙන්නුවා ජනතාව ඉන්නෙ අපි එක්ක කියලා. . . . කොටි බිත්තියට හේත්තු වෙලා ආන්ඩුවේ මිලිටරියට මුහුන දී ඇති මුල්ම වතාව නෙවෙයි මේක." යයි නඩේසන් පැවසී ය. කෙසේ වෙතත්, අතීත ජයග්‍රහනයන්ට කෙරෙන මෙම ආයාචනා මගින් අවධාරනය කෙරෙන්නේ, එල්ටීටීඊයේ දුර්වල වී ඇති දේශපාලනික හා මිලිටරි තත්වයයි.

වෙනම දෙමල රාජ්‍ය කැබැලිත්තක් පිලිබඳ එල්ටීටීඊයේ ඉදිරිදර්ශනය නිරතුරුව ම පදනම් කෙරුනේ ඉන්දියාවේ සහ ඒ හෝ මහ බලවතකුගේ සහයෝගය මත ය. එහි මිලිටරි ජයග්‍රහනවලින්, විශේෂයෙන් ම 2000 දී ලද ජයග්‍රහනවලින්, පසුව, එල්ටීටීඊය 2002 දී එක්සත් ජාතික පක්ෂයේ (එජාප) නායකත්වයෙන් යුක්ත ආන්ඩුව සමග සටන් විරාම ගිවිසුමක් අත්සන් කොට උතුරු හා නැගෙනහිර පලාත්වලට දේශපාලන ස්වතන්ත්‍ර භාවයක් ලබා දෙනු ඇති බලය බෙදා ගැනීමේ සැකැස්මක් වෙනුවෙන් සාකච්ඡා සඳහා අවතීර්න විය. එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය සහ නෝර්වේ සාකච්ඡාවලට නිල වසයෙන් අනුග්‍රහය දැක්වූ අතර ඉන්දියාව ද සාකච්ඡාවලට පිටුබලය සැපයී ය. එහෙත් මෙම එකඳු බලවතෙක් වත් එල්ටීටීඊයට සැලකිය යුතු බලයක් විමධ්‍යගත කිරීමකට සහාය දුන්නේ නැත. විශේෂයෙන් ම එක්සත් ජනපදය අවධාරනය කලේ, මොන යම් හෝ ප්‍රගතියක් ලබා ගැනීමට නම්, එල්ටීටීඊය "ත්‍රස්තවාදය" අතහැර නිරායුධ විය යුතු බව යි.

2006 මැද දී රට යළි යුද්ධයට ඇද දැමීමේ ජනාධිපති මහින්ද රාජපක්ෂගේ තීන්දුවට හෝ මේ වසර මුල දී සටන් විරාම ගිවිසුම ඉරා දැමීමට ඔහු ගත් පියවරට හෝ මේ එකඳු බලවතෙක් වත් විරුද්ධ වූයේ නැත. යුද්ධය යලි ඇරඹූ අවස්ථාව වන විට, නව ආයුධ මිලදී ගැනීම් හරහා ශ්‍රී ලංකා මිලිටරියේ ධාරිතාව ඉහල දමනු ලැබ තිබුනි. හමුදා කඳවුරුවලට මල්ටි-බැරල් රොකට් විදිනයන්ගෙන් හා කාලතුවක්කුවලින් ප්‍රහාර එල්ල කිරීමට 2000 දී එල්ටීටීඊය සමත් වූයේ යම් සේ ද, දැන් තීරනාත්මක වාසිය පැවතුනේ මිලිටරිය අත ය. තම නව යුද ගුවන් යානා සහ දිගු පරාස සහිත කාලතුවක්කු එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලට එරෙහිව ඉව බවක් නැතිව යොදා ගැනීමට එය කිසිසේත්ම පැකිලී නැත.

එමෙන් ම, එල්ටීටීඊය ජාත්‍යන්තර වසයෙන් හුදකලා වී ඇත. බුෂ් පාලනාධිකාරයේ පීඩනය යටතේ, කැනඩාව සහ යුරෝපා සංගමය යන දෙගොල්ල ම, එල්ටීටීඊය "ත්‍රස්තවාදී සංවිධානයක්" ලෙස තහනම් කොට, විශාල දෙමල විදේශගත ප්‍රජාව වෙතින් දේශපාලනික හා මූල්‍යමය සහයෝගය ලබා ගැසීමේ එහි හැකියාවට වල කපා ඇත.

සාම ක්‍රියාදාමයේ සම-සභාපතිවරු -- එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය සහ නෝර්වේ -- පසුගිය බදාදා එක්සත් ජාතීන්ගේ සමුලුව අවස්ථාවේ දී හමු වී යුද ගැටුම්වලට මැදිව ඇති සිවිල් ජනයා පිලිබඳ උත්සුකතාව ප්‍රකාශ කරන මුලුමනින් ම කුහක ප්‍රකාශයක් නිකුත් කලහ. එම රැස්වීම "සිවිල් ජනයාගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මේ දැන් විශාල වසයෙන් අවධාරනය" කොට "ඔවුන් අල්ලා ගන්නා ප්‍රදේශවල ජනයාගේ මානව හිමිකම්වල ආරක්ෂාවට" ගරු කරන ලෙස ආන්ඩුවෙන් ඉල්ලා සිටි බව ද එක්සත් ජනපදයේ සහකාර රාජ්‍ය ලේකම් රිචඩ් බව්චර් මාධ්‍යවලට පැවසී ය.

කෙසේ වෙතත්, එක්සත් ජාතීන්ගේ සියලු ආධාර නිලධාරීන් කිලිනොච්චියෙන් පිටවිය යුතු යැයි සති දෙකකට පෙර ශ්‍රී ලංකා ආන්ඩුව අන කලේ ය. එහි මූලෝපාය වන්නේ, මූලික අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයුම් සීමා කිරීම ද ගුවන් ප්‍රහාරවලින් හා කාලතුවක්කු ප්‍රහාරවලින් ප්‍රදේශයේ ජනතාව ත්‍රස්ත කිරීම ද මගින් එල්ටීටීඊ-පාලිත වන්නි ප්‍රදේශය වටා සිය ග්‍රහනය දැඩි කිරීම යි. ගුවන් හමුදාව ආන්ඩුවේ පාලන ප්‍රදේශවලට පලා එන ලෙස සිවිල් වැසියන්ගෙන් ඉල්ලා සිටින පත්‍රිකා විසුරුවා හැර තිබේ. එසේ පැමින ඇත්තේ මිනිසුන් අතලොස්සක් පමනි. ඒ ආංශික වසයෙන් එල්ටීටීඊයේ සීමාකිරීම් සහ එමෙන් ම ආන්ඩුව හා මිලිටරිය කෙරෙහි දක්වන භීතිය හා වෛරය ද හේතු කොට ගෙන ය.

ශ්‍රී ලංකා ආන්ඩුව යුද්ධය යොදා ගෙන ඇත්තේ, ජනතාව එල්ටීටීඊයෙන් "මුදාගෙන" ඔවුන්ගේ "මානව හිමිකම්" තහවුරු කිරීමට නොව, එල්ටීටීඊය වෙතින් අත්පත් කර ගන්නා ප්‍රදේශවල පමනක් නොව මුලු දිවයින පුරා ම පොලිස්-රාජ්‍ය විධික්‍රම දිගේලි කිරීමට ය. විශේෂයෙන් ම දෙමල සුලුතරය කුමානුකූල හිරිහැරයන්ට, බියගැන්වීම්වලට සහ නඩු විභාග නැතිව හිතුවක්කාරී ලෙස අත්අඩංගුවට ගැනීම්වලට ඉලක්ක කෙරී ඇත. පසුගිය වසර දෙකක කාලය තුල, මිලිටරිය විසින් මෙහෙයවනු ලබන හෝ නැතිනම් එහි සහයෝගය සහිතව ක්‍රියාත්මක වන ඝාතක කල්ලි විසින් සිය ගනනක් පැහැර ගැනීමට හා ඝාතනයට ලක් කොට තිබේ.

උතුරේ යුද ගැටුම් හේතු කොට ගෙන 300,000ක පමන ජන පිරිසකට පලා යාමට බල කෙරී ඇතැයි තක්සේරු කෙරේ. කිලිනොච්චියෙන් ඉවත් වීමට බල කෙරී ඇති එක්සත් ජාතීන්ගේ ආධාර ඒජන්සි, ප්‍රමානවත් ආහාර, වාසස්ථාන හ ඖෂධ නොමැති මෙම සරනගතයන්ගේ ඉරනම සම්බන්ධයෙන් උත්සුකතාව ප්‍රකාශ කර ඇත. එක්සත් ජාතීන්ගේ සමුලුව අවස්ථාවේ පැවති රැස්වීමෙන් පසුව ලබා දුන් සුලු සහනයක් ලෙස, ශ්‍රී ලංකා ආන්ඩුව නිවේදනය කර ඇත්තේ, වන්නියේ සරනගතයන්ට ආහාර සැපයුම් රැගෙන යන වාහන සමග යාමට එක්සත් ජාතීන්ගේ නිලධාරීන්ට තමන් අවසර දෙන බව යි.

යුද්ධයේ බර සම්බන්ධයෙන් වැඩ කරන ජනතාව අතර පුලුල්ව පැතිර පවත්නා වෛරය අපසරනය කරනු වස් එල්ටීටීඊයට එරෙහි ජයග්‍රහනයක් ලබා ගනු සඳහා රාජපක්ෂ ආන්ඩුව නොසන්සුන්ව සිටී. 25 වසරක යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස දැනටමත් මිනිස් ජීවිත 70,000කට වැඩි ප්‍රමානයක් විනාශ වී තිබේ. පසුගිය වසර දෙක තිස්සේ පවතින දැවැන්ත යුද වියදම් උද්ධමනය සියයට 30 දක්වා ඉහල දැමීමට හා ජීවන මට්ටම්වලට වල කැපීමට ප්‍රධාන සාධකයක් වී ඇත.

එල්ටීටීඊයේ මිලිටරි පරාජයක් ශ්‍රී ලංකාවේ වත්මන් දේශපාලන හා ආර්ථික අර්බුදය විසඳලනවා නොව, දිවයිනේ ධනේශ්වර පාලනයේ ස්වභාවය තුල ම මුල් බැස පවතින වාර්ගික ගැටුමේ ස්වභාවය පමනක් වෙනස් කරලනු ඇත. ආකාරගත නිදහසේ පටන් මේ දක්වා, අනුප්‍රාප්තික ආන්ඩු කම්කරු පන්තිය භේද කිරීමේ හා දුර්වල කිරීමේ විධික්‍රමයක් ලෙස සිංහල ස්වෝත්තමවාදය නැවත නැවතත් ගසාකා තිබේ. 1983 දී යුද්ධය පැන නැගීම සිදු වූයේ සිය ගනනකට මරනය සහ දෙමල ජනයාගේ නිවාසවලට හා ව්‍යාපාරවලට විනාශය ගෙන ආ දිවයින පුරා පැවති දෙමල-විරෝධී ම්ලේච්ඡ ජනඝාතන ව්‍යාපාරයකට පසුව ය. දැන් වසර 25කට පසුව, දිවයිනේ ආර්ථික හා සමාජ ගැටලුවලට කිසිදු විසඳුමක් නැති රාජපක්ෂ ආන්ඩුව, යුද්ධය හා සිය පොලිස්-රාජ්‍ය විධික්‍රම යුක්තියුක්ත කිරීමට ද සාමාන්‍ය වැඩ කරන ජනතාවගෙන් එක දිගට කැප කිරීම් ඉල්ලා සිටීමට ද වර්ගවාදී තුරුම්පුව ක්ෂමා විරහිත ලෙස යොදා ගනී.